2020 . 02 . 27 දිවයින.



# උද්ධමනය 7.6% දක්වා ඉහළ නගී

ශ්‍යාම් නුවන් ගනේවත්ත

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය පසුගිය දෙසැම්බර් මාසයේ පැවැති සියයට 6.2 සිට 2020 ජනවාරි මාසයේදී සියයට 7.6 දක්වා ඉහළ ගොස් තිබේ.

ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහි ම අයිතමයන්හි මිල ගණන්වල සිදු වූ මාසික ඉහළ යෑම් මේ සඳහා දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය පසුගිය දෙසැම්බර් මාසයේදී පැවැති සියයට 8.6 හි සිට 2020 ජනවාරි මාසයේදී 2017 නොවැම්බර් මාසයෙන් පසු වාර්තා වූ ඉහළම අගය වන සියයට 13.7 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ.

එසේම ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2020 ජනවාරි මාසයේදී සියයට 3.0 ක් ලෙස වාර්තා වී ඇත.